**01-05-2022 මධුබන් අව්‍යක්ත් බාප්දාදා ඕම් ශාන්ති 1990/12/13**

**තපස්යාවේ පදනම වන්නේ අසීමිත නිරාශාවයි.**

අද දින සියලුම ආදරණීය දරුවන්, බාබාට සෙනෙහස් මල් පුදන අන්දම බාප්දාදා දකිනවා. මේ දේශයේ සහ විදෙස් රටවල සියලුම දරුවන්ගේ හදවත් වලින් පැන නඟින සෙනෙහස් මල් වරුසාව බාප්දාදා දකිනවා. ඔබ එය සංගීතය ලෙස හැඳින්වුවත් ගීතයක් ලෙස හැඳින්වුවත් බාබාට සියලුම දරුවන්ගේ හදවත් වලින් එකම සංගීතය හෝ ගීතය ඇසෙනවා. එය එකම ගීතයයි 'මගේ බාබා.' බාබා සමග හමුවක් සැමරීමේ පිවිතුරු බලාපොරොත්තුවේ පහන් සෑම තැනකම දිළිසනවා. කල්පය පුරාම, බාප්දාදා සහ දරුවන් හැර වෙනත් කිසිවෙකුට මෙම දිව්‍යමය ජවනිකාව දැක ගත නොහැක. මෙම අසහාය සෙනෙහසේ මල්, මෙම පැරණි ලෝකයේ ඇති කෝහිනූර් දියමන්තියටත් වඩා වටින්නේය. හදවතේ එවන් ගීත ගායනා කළ හැක්කේ වෙනත් කිසිවෙකුට නොව, ඔය දරුවන්ට පමණයි. වෙනත් කිසිවෙකුට එවන් දීපමාලාවක් සැමරිය නොහැක. සියලුම දරුවන් බාප්දාදා ඉදිරියේ මතුවී සිටියි. සියලු දෙනාටම මෙම භෞතික ස්ථානයේ අසුන් ගත නොහැක, නමුත් බාප්දාදාගේ හදවත් සිහසුන ඉතාම විශාලයි. මතු වී ඇති සියලු දෙනාව ඔහු දකින්නේ මෙලෙසයි. සියලු දෙනාගේ සෙනෙහස සහ සිහි කිරීම සමගම ඔවුන්ගේ අයිතියක් ලෙස සලකන මිහිරි පැමිණිලිද බාබාට ඇසෙයි. ඒ සමගම බාබා සෑම දරුවෙකුටම ප්‍රතිලාභයක් ලෙස ප්‍රකෝටි ගුණයකට වඩා වැඩි සෙනෙහස සහ සිහි කිරීම ලබා දෙනවා. ඔබට ශාරීරික ස්වරූපයෙන් හමුවක් සැමරීමට අවශ්‍ය බව ඔය දරුවන් අයිතියක් ඇතිව පවසයි. පියාට මෙම ආශාව තිබෙන අතර දරුවන්ටද මෙම ආශාව තිබේ. කෙසේවෙතත්, කාලයට අනුව, බ්‍රහ්ම පියා, ඔහුගේ අව්‍යක්ත සූරදූත ස්වරූපයෙන් ඔහුගේ ශාරීරික ස්වරූපයෙන් සිදු කළාට වඩා කෝටි ගුණයක් වේගයෙන් සේවය කරමින් දරුවන්ව ඔහු හා සමාන බවට පත් කරවමින් සිටියි. එක වසරක් හෝ දෙකක් නොව බොහෝ වසර ගණනාවක් අව්‍යක්ත හමුවක අත්දැකීම සහ අව්‍යක්ත ස්වරූපයේ ඔහුගේ සේවය ඔබට ලබා දී ඇත, එමෙන්ම ඔහු තවමත් ඔබට එම අත්දැකීම ලබා දෙනවා. බ්‍රහ්ම පියා අව්‍යක්ත වන නමුත් ඔහු භෞතික චරිත කොටසක් රඟපාන්නේ ඇයි? ඔබව ඔහු හා සමාන බවට පත් කිරීමටයි. බ්‍රහ්ම පියා සූක්ෂම බවින් ශාරීරික බවට පැමිණෙයි එබැවින් ඔය දරුවන් ප්‍රතිඋපකාරයක් ලෙස කළ යුත්තේ කුමක්ද? ශාරීරික බවින් සූක්ෂම වන්න. සූක්ෂම ස්වරූපය තුළින් අව්‍යක්ත හමුවේ සේවය සිදු කිරීම, කාලයට අනුව උපරිම ලෙස අවශ්‍යයි. මේ නිසයි සූක්ෂම හමුවක් අත්විඳින ලෙස බාප්දාදා විටින් විට ඔබට සංඥාවක් ලබා දෙන්නේ. එබැවින් ඔබ තපස්යාවේ වර්ෂය දැන් සමරනවා නේද? දරුවන් වැඩි දෙනෙකුගේ උනන්දුව සහ උද්යෝගය ඉතා හොඳ බව බාප්දාදා සතුටු වනවා. වැඩසටහනට අනුව ඔවුන් යමක් කළ යුතු බව සිතන්නේ දරුවන්ගෙන් සුළු දෙනෙක් පමණයි. එකක්, වැඩසටහනට අනුව යමක් කිරීම වන අතර අනෙක ඔබගේ හදවතින් උනන්දුවෙන් සහ උද්යෝගයෙන් එය කිරීමය. ඔය සෑම කෙනෙක්ම තමන්ගෙන් විමසිය යුතුයි මා ඉන්නේ කුමන කාණ්ඩයේද?

වර්තමානයේ, අවස්ථාවන්ට අනුව, ස්ව-ප්‍රගතියට අනුව, සේවයේ සීඝ්‍ර වේගයට අනුව සහ බාප්දාදාගේ සෙනෙහසට ප්‍රතිඋපකාරයක් ලබා දීම සඳහා තපස්යාව අත්‍යාවශ්‍යයි. සෙනෙහස තිබීම පහසුයි, එමෙන්ම සියලු දෙනා තුළ සෙනෙහස තිබේ බාබාද මෙය දන්නවා. කෙසේවෙතත්, ප්‍රතිඋපකාරයක් ලෙස ඔය සෑම කෙනෙක්ම බාප්දාදාට සමාන වනවා දැකීමට බාප්දාදාට අවශ්‍යයි. දැන් බාප්දාදාට දැකීමට අවශ්‍ය වන්නේ මෙයයි. මෙහිදී සුළු පිරිසෙන්ද ටික දෙනෙක් සිටියි. සියලු දෙනා තුළම මෙම ආශාව තිබේ නමුත් ආශාව ඇති අයගේ සංඛ්‍යාව සහ එය ක්‍රියාවට නංවන අය අතර වෙනසක් තිබේ. තපස්යාවේ පහසු සහ නිරන්තර පදනම වන්නේ අසීමිත නිරාශාවයි. අසීමිත නිරාශාව තිබීම යනු සතර පැත්තේම වෙරළ (ආධාරක) අත්හැරීමයි. ඇයි? මන්ද, ඔබ වෙරළ ඔබගේ ආධාරකය බවට පත් කරගෙන තිබේ. කාලයට අනුව සෙනෙහසින් යුතු වීම සහ ඉන්පසුව උපකරණ ජීවාත්මයන්ගෙන් ඔබට ලැබෙන ශ්‍රීමත් සහ සංඥාවන්ට අනුව, ඔබගේ බුද්ධිය තත්පරයකදී සෙනෙහසේ සිට නොබැඳී තත්ත්වයට පත් කර ගැනීම මෙය සිදු වන්නේ නැහැ. ඔබ සෙනෙහසින් යුතු වන වේගයෙන්ම ඔබ නොබැඳී සිටින්නේ නැහැ. සෙනෙහසින් යුතු වීම අතින් ඔබ හොඳ නමුත් නොබැඳී සිටීම අතින් ඔබ දෙවරක් ඒ ගැන සිතා, ඔබට එඩිතරකම අවශ්‍ය බව ඔබ සිතයි. නොබැඳී සිටීම යනු ආධාරක අත්හැරීමයි, එමෙන්ම ආධාරක අත්හැරීම යනු අසීමිත නිරාශාවේ ආකල්පයක් තිබීමය. වෙරළක් ඔබගේ ආධාරකය බවට පත් කර එය අල්ලා සිටින අන්දම ඔබ දන්නවා, නමුත් එය අත්හැරීමට

සිදුවන විට ඔබ කරන්නේ කුමක්ද? ඔබ විශාල ප්‍රශ්නාර්ථ ලකුණක් දමයි. සේවය භාරව සිටින අන්දම ගැන ඔබ ඉතා හොඳින් දන්නවා, නමුත් භාරව සිටින අතරම තමන්ගේ හෝ අන් අයගේ බැටරිය චාජ් කිරීම ඔබට අපහසු බව දැනෙයි. මේ නිසයි වත්මන් කාලයේ, තපස්යාව තුළින් ඔබට අසීමිත නිරාශාවේ ආකල්පයක් ඇති කර ගැනීම, උපරිම ලෙස අවශ්‍ය වන්නේ.

තපස්යාවේ සාර්ථකත්වය අත්කර ගැනීමේ විශේෂ පදනම සහ පහසු මාර්ගය වන්නේ ‘එක‘ යන පාඩම ස්ථිර කරගැනීමය. ‘2‘ හෝ ‘3‘ යන ඉලක්කම් ලිවීම අපහසුයි. ‘1‘ ලිවීම ඉතා පහසුයි. තපස්යාව යනු, එක්කෙනෙකුට අයත් වීමයි. ඒකායන කෙනාට (එක්නාමී) අයත් වීම ලෙස බාප්දාදා හඳුන්වන්නේ මෙයයි. තපස්යාව යනු මනස සහ බුද්ධිය ස්ථාවර (ඒකාග්‍ර) කරගැනීමයි. තපස්යාව යනු හුදෙකලාව (ඒකාන්ත්) සිටීමට ප්‍රිය කිරීම. තපස්යාව යනු ස්ථාවර ස්ථිතියක් (ඒක් රාස්) පවත්වා ගැනීමයි. තපස්යාව යනු ඔබට හිමි වී ඇති සියලුම සම්පත් අපතේ හැරීම නතර කිරීමයි, එනම්, අරපිරිමැස්මෙන් ගමන් කිරීමයි. එබැවින් ‘එක‘ යන පාඩම දැන් ස්ථිරයි නේද? ‘එක‘ යන පාඩම අපහසුද, පහසුයිද? එය පහසුයි, නමුත්... ඔබ එවන් භාෂාවක් භාවිත කරන්නේ නැහැ නේද?

බොහෝ අන්දමේ වෙහෙස වීම් වලින් ඔබව නිදහස් කිරීම ගැන ඔබ බොහෝ සේ භාග්‍යවන්තයි. කාලය විසින් ලෝකයේ මිනිසුන්ව සූදානම් කරයි, එමෙන්ම කාලයට අනුව වෙනත් කළ යුතු දෙයක් නොමැති නිසා ඔවුන් සූදානම් වෙයි, නමුත් පරම පියා ඔය දරුවන්ව එම කාලයට පෙර සූදානම් කරන අතර ඔබ එය කරන්නේ පියා කෙරෙහි ඇති සෙනෙහස නිසයි. ඔබ එය සෙනෙහස නිසා නොකරන්නේ නම් හෝ ඔබ සුළුවෙන් පමණක් කරන්නේ නම්, එවිට කුමක් වෙයිද? ඔබට වෙන කළ හැකි දෙයක් නැති නිසා එය කිරීමට සිදුවෙයි. ඔබට නියත වශයෙන්ම අසීමිත නිරාශාව තිබිය යුතු වෙයි. කෙසේවෙතත්, වෙනත් කළ යුතු දෙයක් නොමැති වීමෙන් එය කළ විට, ඔබට ඉන් ඵල නොලැබෙයි. සෙනෙහසේ ක්ෂණික ඵලයද අනාගත ඵලය ලෙස එක්රැස් වෙයි. වෙන කළ හැකි දෙයක් නොමැති වීම නිසා එය කරන අයට තරණය කිරීමට සිදු වන්නේ කුමක්ද? යමක් තරණය කිරීමට සිදුවීම කුරුසයක් මත සිටීම හා සමානයි. ඔබ කැමති කුමටද? ඔබ සෙනෙහස නිසා එය කරයි. ආධාරක වල ලැයිස්තුව ගැන බාප්දාදා ඔබට යම් වෙලාවක පවසන්නම්. ඒ පිළිබඳව දැන ගැනීම ගැන ඔබ කොහොමත් දක්ෂයි, නමුත් බාබා එය නැවත පුනරීක්ෂණය කරන්නම්, මන්ද, බාප්දාදාට අවශ්‍ය ඕනෑම විටෙක ඔහුට දරුවන්ගේ දිනචර්යාව දැක ගත හැක. දවස පුරාම සෑම කෙනෙකුගේම දවසේ කාල සටහන දෙස බැලීමේ ව්‍යාපාරය ඔහු කරන්නේ නැහැ. ඔබ ශාරීරික බ්‍රහ්ම පියාව දුටුවා ඔහුගේ දෘෂ්ඨිය ඉබේම වැටුණේ කොහේද? එය ලිපියක් වුණත් සටහනක් වුණත් හෝ එය කාගේ හෝ හැසිරීමක් වුවද, එය පිටු අටක ලිපියක් වුණත්, ඔහුගේ දෘෂ්ඨිය වැටුණේ කුමක් මතද? උපදෙසක් දිය යුතු තැනක, එය අවශ්‍ය වූ තැනක. බාප්දාදා සෑම දෙයක්ම නිරීක්ෂණය කරන නමුත් ඔහු දකින්නේ නැත. ඔහු සෑම දෙයක්ම හඳුනන නමුත් ඔහු නොදනී. අවශ්‍ය නැති ඕනෑම දෙයක් - ඔහු නොදකින අතර ඒ ගැන නොදනී. ඔහු ඉතා හොඳ ක්‍රීඩා නරඹයි. බාබා ඔබට ඒ ගැන වෙනත් වෙලාවක කියන්නම්. අච්චා. තපස්යාවේ සිටීම සහ අසීමිත නිරාශාවේ ආකල්පයක් පවත්වා ගැනීම පහසුයි නේද? වෙරළ අතහැර යාම අපහසුද? කෙසේවෙතත්, යම් දෙයක් බවට පත්වීමට අවශ්‍ය අය ඔබලාය. ඔබ සෑම කෙනෙක්ම සෑම කල්පයකදීම ලැබීම් වලට අයිතියක් හිමි කරගෙන තිබේ, එබැවින් ඔබ නියත වශයෙන්ම එය බවට පත් වෙයි. අච්චා. පෙර කල්පයේ දරුවන්, බොහෝ කල්ප අතින් පැරණි සහ මේ කල්පයේ අළුත් අයට, මේ වසරේ අවස්ථාවක් ලබා දී ඇත. ඔබට අවස්ථාවක් ලබා දීම ගැන ඔබ සතුටු වනවා නේද? වැඩි දෙනෙක් අළුත් වන අතර ගුරුවරු පැරණියි. ගුරුවරුන් කරන්නේ කුමක්ද? ඔබ නිරාශාවේ ආකල්පයක් ධාරණය කරගන්නවා නේද? ඔබ වෙරළ අත්හරිනවාද? එසේ නැත්නම්, ඔබට එය කිරීමට අවශ්‍ය නමුත් එය කරන්නේ කෙසේද කියා ඔබ අසයිද? ඔබ, එය කිරීමෙන් අන් අයට පෙන්වන අයද, නැත්නම් ඒ අන්දමින් කතා කරන අයද? සෑම තැනකින්ම, ශාරීරික ස්වරූපයෙන් පැමිණ ඇති සියලුම දරුවන් දැකීමෙන් බාබා සතුටු වනවා. ඔබ එඩිතරකම පවත්වා ගෙන ඇති අතර ඔබට කොහොමත් පරම පියාගේ උපකාරය සෑම විටම ලැබෙනවා. එබැවින් එඩිතරකමින්, පියාගේ උපකාර ලැබීමට අයිතියක් සෑම විටම නොකඩවා අත්විඳ, අඛණ්ඩව පහසුවෙන් පියාසර කරන්න. පියා උපකාර කරනවා, නමුත් එය අවශ්‍ය අය එය ලබා ගත යුතුයි. පිරිනමන්නා දෙන නමුත් එය ගන්නා අය එසේ කරන්නේ ඔවුන්ගේ ධාරිතාවයට අනුවයි. එබැවින් ඔබ තමාගේම ධාරිතාවයට අනුව ගන්නා අය නොව, නමුත් නිරන්තරයෙන් සියලු-බල ඇති අය විය යුතුයි. එවිට පමා වී එන අය, ඉදිරි අංකයක් ගනිවි. ඔබට වැටහෙනවාද? සියලු බල වලට ඔබගේ සම්පූර්ණ අයිතිය හිමි කරගන්න. අච්චා.

සෑම දිශාවකම සිටින සියලුම ආදරණීය ජීවාත්මයන්ට, පරම පියාගේ සෙනෙහසට නිරතුරුව ප්‍රතිඋපකාරයක් ලබා දෙන විශේෂ ජීවාත්මයන්ට, තපස්යා ප්‍රතිමූර්තියක ස්ථිතියේ නිරන්තරයෙන් ස්ථාවරව රැඳී සිටින අයට, පියාට සමීප ජීවාත්මයන්ට, පියාට සමාන වීමේ අරමුණේ ගුණ නිරන්තරයෙන් ප්‍රායෝගික ස්වරූපයකට දමන අයට, මේ දේශයේ සහ විදෙස් රටවල සියලුම දරුවන්ට, හදවතට සැනසුම ගෙනෙන බාබාගේ හදවතේ ගැඹුරුම පත්ලෙන් සෙනෙහස, ස්මරණය සහ නමස්කාරය.

**අව්‍යක්ත බාප්දාදා දාදීන් මුණගැසෙමින්**

අෂ්ඨ බල සහිත ඔය අය, ඔබ විශේෂ ආදරණීය දේවතාවන් (ඉෂ්ඨ) සහ අටෙන් කෙනෙක්, එහෙම නේද? අටෙන් කෙනෙක් වන අයෙකුගේ ලක්ෂණ මොනවාද කියා ඔබ දන්නවාද? ඔවුන් සෑම බලයක්ම, සෑම ක්‍රියාවක් වෙනුවෙන්, කාලයට සහ අවස්ථාවට නිසි අන්දමින් භාවිත කරන අයයි. බල අට, ඔබව විශේෂ ආදරණීය දේවතාවක් කරවන අතර ඔබව අටෙන් කෙනෙක් බවටත් පත් කරවයි. ඔබ බල අට ඇති අයයි, ඔවුන් දේවතාවන්ව අත් අටක් ඇතිව පෙන්වන්නේ මේ නිසයි ඔවුන්ට විශේෂ බල අටක් තිබේ. ඇත්ත වශයෙන්ම බොහෝ බල තිබේ, නමුත් වැඩි ප්‍රමාණයක් අට තුළ ඇතුලත් වී තිබේ. විශේෂ බල, නිසි වෙලාවට භාවිත කළ යුතුයි. කාලයට අනුව, අවස්ථාවට අනුව, ඔබගේ මනෝ ස්ථිතිය තිබිය යුතුයි. මෙය, අට දෙනාගෙන් කෙනෙක් සහ විශේෂ ආදරණීය දේවතාවක් වීමස ලෙස හැඳින්වෙයි. ඉතිං, එවන් කණ්ඩායමක් සූදානම් නේද? විදේශයන්හි කී දෙනෙක් සූදානම්ද? ඔබත් අටෙන් කොටසක් වීමට යනවා නේද? අච්චා.

**(සන්ත්‍රි දාදී අම්රිත් වේලාවේ ඇගේ සිරුර හැර ගියා - 1990/12/13)**

එය හොඳයි. සෑම කෙනෙක්ම අනිවාර්යෙන් යා යුතුයි. ඔබ නිති සූදානම්ද? එසේ නැත්නම් 'මගේ මධ්‍යස්ථානය සහ මගේ ශිෂ්‍යයන්ට කුමක් වෙයිද' කියා ඔබට මතක් වෙයිද? ඔබ 'මගේ, මගේ' සිහි කරන්නේ නැහැ නේද? සෑම කෙනෙක්ම යා යුතුයි, නමුත් එක් එක්කෙනාගේ ගිණුම් ඔහුටම අයත්ය. කිසිවෙකුට තම ගිණුම් නොපියවා යා නොහැක. මේ නිසයි සෑම කෙනෙක්ම සතුටින් සමුදුන්නේ. ඔබ සියලු දෙනාම එයට කැමති වුණා නේද? ඒ අන්දමින් යෑම හොඳයි. එබැවින් ඔබ නිති සූදානම් විය යුතුයි. අච්චා.

**බාප්දාදා කණ්ඩායම් මුණගැසෙමින්**

1. දිල්ලිය සහ පන්ජාබ් යන දෙකම සේවයේ මුල්ම ස්ථානයි. ස්ථාපනයේ ස්ථාන (ආරම්භයේ) සෑම විටම දකින්නේ සහ සිහි කරන්නේ එම වැදගත්කමින්. සේවයේ මුල් ස්ථාන ඒවා වන සේම, ඔබගේ මනෝ ස්ථිතියෙන් ඔබ ආදිතම මැණික්ද? ස්ථානය සමගම ස්ථිතියද ප්‍රශංසාවට ලක් වෙයි. ආදි මැණික් යනු, සෑම ශ්‍රේෂ්ඨ උපදේශයක්ම තම ජීවිතයට එකතු කරගැනීමට මුලපුරන අයයි, නිකම්ම ඒවාට සවන් දී අන් අයට ඒවා පවසන අය නොවෙයි, නමුත් ඒවා සැබවින්ම කරන අයයි, මන්ද, යමකට සවන් දී නිකම්ම අන් අයට එය පවසන බොහෝ දෙනෙක් සිටියි, නමුත් එය සැබවින්ම ක්‍රියාවට නංවන අය ඉන්නේ කෝටි ගණනකින් අතලොස්සයි. එබැවින් තමා කෝටි ගණනකින් අතලොස්සක් වීමේ කුල්මත් බව ඔබට තිබෙනවාද? මෙම ආධ්‍යාත්මික කුල්මත් බව මායාගේ විවිධ අන්දමේ කුල්මත් බවින් ඔබව නිදහස් කරවයි. මෙම ආධ්‍යාත්මික කුල්මත් බව ආරකෂාවේ මහකි. මායාගේ කිසිම කුල්මත් බවක් - (හොඳ) ඇඳුම් ඇඳීම, කෑම හෝ යමක් දෙස බැලීම - ඔබව ආකර්ෂණය කළ නොහැක. ඔබ එවන් කුල්මත් බවක සිටිනවාද, නැත්නම් මායා ඔබව ටිකක් ආකර්ෂණය කරනවාද? ඔබ දැන් නුවණැත්තන් වෙලා නේද? ඔබට දැන් මායා ගැනත් වැටහෙනවා. නුවණැත්තන් කිසිදා මුලා වන්නේ නැහැ. නුවණැත්තන් මුලා වන්නේ නම්, එවන් පුද්ගලයෙක් ගැන සියලු දෙනා කුමක් කියයිද? ඔබට නුවණ තිබුණත් ඔබ මුලා වන බව` මුලා වීම යනු දුක කැඳවීමයි. ඔබ මුලා වන විට ඔබට එයින් දුක ඇති වෙනවා නේද? කිසිවෙකුට දුක ගැනීමට අවශ්‍ය වෙයිද? මේ නිසයි ඔබ සෑම විටම ආදිතම මැණික්ය, එනම්, සෑම ශ්‍රේෂ්ඨ උපදෙසක්ම ඔබගේ ජීවිතයට එකතු කර ගැනීමේදි ඔබ පළමු තැන ගනී. ඔබ එවැනිද? නැත්නම් වෙන අය එය කරනවාද කියා බලා සිට, ඉන්පසුව පමණක් ඔබ එය කරනවාද? 'ඒ අය මෙය කරන්නේ නැහැ, ඉතිං මා එය කෙසේ කරන්නද?' මෙය කිරීමේදි 'ප්‍රථමයෙන් මම' වන්න. එය මෙසේ නොවිය යුතුයි, 'අන් අය වෙනස් වන විට මා වෙනස් වෙන්නම්, මේ කෙනා වෙනස් වූ පසු මා වෙනස් වෙන්නම්.' නැහැ. යමක් කරන කෙනාට එහි ප්‍රතිලාභය හිමි වෙයි. ඔබට කෙතරම් ලැබෙයිද? එකක් වෙනුවෙන් කෝටි ගුණයක්. එබැවින් මෙය කිරීමේ සතුටක් තිබෙනවා නේද? එක ගුණයක් සිදුකර, කෝටි ගුණයක ප්‍රතිලාභයක් ලබා ගන්න` මෙහි ඇත්තේ ලැබීම්ය, වෙනත් කිසිවක් නොව, ලැබීම්මයි. එබැවින් ශ්‍රීමත්

ප්‍රායෝගික ස්වරූපයකට දැමීමේදී 'පළමුව මම' වන්න. මායාගේ බලපෑමට හසු වීමට 'පළමුව මා' නොවන්න, නමුත් මෙම උත්සාහයේ 'පළමුව මා' වන්න, මන්ද, ඔබ සෑම පියවරකම සාර්ථකත්වය අත්විඳින්නේ එවිට පමණයි. සාර්ථකත්වය සහතිකයි. සිදුවන්නේ ඔබගේ මාර්ගය ඔබ ටිකක් වෙනස් කරන අතර ඉන්පසුව, එය වෙනස් කිරීම නිසා, ඔබගේ ගමනාන්තය ඈත් වන අතර ඒ සඳහා ඔබට කාලය ගත වෙයි. යමෙක් වැරදි මාර්ගයක ගියොත් ගමනාන්තය ඈත් වෙයි නේද? එබැවින් එය නොකරන්න. ඔබගේ ගමනාන්තය තිබෙන්නේ ඔබගේ අතේ දුරින් වන අතර සාර්ථකත්වය සහතිකයි. ඔබට ටිකක් වෙහෙස වීමට සිදුවන විට, තරාදියේ, සෙනෙහස පැත්තේ බර ටිකක් අඩු වෙයි. සෙනෙහස ඇත්නම් ඔබට කිසි විටෙක වෙහෙස වීමට සිදු නොවෙයි, මන්ද, ඔහුගේ බොහොමයක් බාහු වලින් පියා ඔබට උපකාර කරයි. ඔහු තත්පරයකදී ඔහුගේ බාහු වලින් කාර්යය සාර්ථක කරවයි. එවිට ඔබගේ උත්සාහයන් වලදී ඔබ නිරන්තරයෙන් අඛණ්ඩව පියාසර කරයි. පන්ජාබයේ සිට පැමිණි අය ඔබ පියාසර කරනවාද, නැත්නම් ඔබ බියට පත්ව සිටියිද? ඔබ බොහෝ අත්දැකීම් ඇති අය වෙලාද? ඔබගෙන් කිසිවෙක් බියට පත් වන්නේ නැහැ? 'කුමක් වෙයිද? එය කෙසේ සිදුවෙයිද?' නැහැ. ඔවුන්ට සාමයේ දානය දෙන අය ඔබයි. ඔබ වෙතට කවුරු පැමිණියත් ඔවුන් සාමයෙන් ආපසු යා යුතුයි ඔවුන් හිස් අතින් නොයා යුතුයි. ඔබ ඔවුන්ට දැනුම ලබා නොදුන්නත්, සාමයේ චිත්ත තරංග ඔවුන්ව සාමකාමී කරවයි. අච්චා.

2. සෑම තැනකින්ම පැමිණ ඇති සියලුම ශ්‍රේෂ්ඨ ජීවාත්ම, බ්‍රහ්මිණ්වරුන්ය ඔබ රාජස්ථාන් හෝ මහා රාශ්ත්‍රයෙන් හෝ මධ්‍ය ප්‍රදේශය ආදියෙන් පැමිණි අය නොවෙයි ඔබ සියලු දෙනාම එකයි. මේ වෙලාවේ ඔබ සියලු දෙනාම මධුබාන්වල නිවැසියන්ය. බ්‍රහ්මිණ්වරුන්ගේ මුල් වාසස්ථානය මධුබාන්ය. ඔබ විවිධ ප්‍රදේශ වලට ගොස් ඇත්තේ සේවය කිරීමටයි. ඔබ එක තැනක පමණක් අසුන්ගෙන සිටින්නේ නම්, සෑම තැනකම ඇති අනෙක් සියලුම ස්ථාන වල සේවය කරන්නේ කෙසේද? මේ නිසයි සේවය කිරීම සඳහා ඔබ විවිධ ස්ථාන වලට ගොස් තිබෙන්නේ. ඔබ ව්‍යාපාරිකයෙක් වුණත්, රාජ්‍ය සේවකයෙක් වුණත්, කර්මාන්තශාලාවක වැඩ කරන කෙනෙක් වුණත් ඔබගේ මුල් වෘත්තිය සේවාධාරියෙක්ය. නිවසේ වාසය කරන අතර මව්වරුන්ද සිටින්නේ පරමාත්ම දෙවියන්ගේ සේවයේය. කෙනෙක් ඥාන කරුණු වලට සවන් දුන්නත් නැතත්, සුබ පැතුම් සහ පිවිතුරු හැඟීම් වල චිත්ත තරංග වලින් ඔවුන්ව පරිවර්ථනය කළ හැක. සිදු කරන සේවය, වචන වලින් කරන සේවය පමණක් නොවෙයි සුබ පැතුම් පවත්වා ගැනීමත් සේවයයි. ඉතිං ඔබ දෙයාකාරයේම සේවය කරන අන්දම දන්නවා නේද? යමෙක් ඔබට අපහාස කළත්, ඔබ සුබ පැතුම් සහ පිවිතුරු හැඟීම් ඇති කිරීම නතර නොකළ යුතුයි. බ්‍රහ්මිණ්වරුන්ගේ යුතුකම වන්නේ සෑම විටම යමක් දීමය. සුබ පැතුම් සහ පිවිතුරු හැඟීම් තිබීමත් ඉගැන්වීම් ලබා දීම වේ. සෑම කෙනෙක්ම වදන් වලින් වෙනස් වෙන්නේ නැහැ. කෙනෙක් කුමනාකාරයේ වුණත්, ඔහු සැබෑ රාවන කෙනෙක් වුණත් අනිවාර්යෙන් ඔහුට අත පිරෙන්න යමක් දෙන්න. ඇතැම් මව්වරු පවසන්නේ අපගේ නෑදෑයන් ශක්තිමත් රාවන කෙනෙක් ඔවුන් කිසිදා වෙනස් වන්නේ නැහැ. එවන් ජීවාත්මයන්ටත් ඔබගේ සම්පත් ගබඩාවෙන් අත පිරෙන්න සුබ පැතුම් සහ පිවිතුරු හැඟීම් ලබා දෙන්න. ඔවුන්ගෙන් සමහරෙක් ඔබට අපහාස කරන විට, ඔවුන් පවසන්නේ කුමක්ද? මේ බ්‍රහ්ම කුමාරීන් ආදි වශයෙන්... එබැවින් ඔවුන්ට අඩු තරමින් බ්‍රහ්ම පියාව මතක් වෙනවා` ඔවුන් ඔබට අපහාස කරන විටදි පවා ඔවුන් බ්‍රහ්මව සිහි කරනවා. ඔවුන් අඩු තරමින් පියාගේ නම සඳහන් කරයි. ඔවුන් ඔහුව දැන ගත්තත් නැතත්, ඔබ ඔවුන්ට අඩු තරමින් අත පිරෙන්න ලබා දෙයි. ඔබ එවන් ජීවාත්මයන්ට යමක් අත පිරෙන්න ලබා දෙනවාද? නැත්නම් සවන් නොදෙන අයව ඔබ පසෙකට දමනවාද? ඔබ ඔවුන්ව පසෙකට නොදැමිය යුතුයි, මන්ද, එවිට ඔවුන් පසුව ඔබගේ කන් දෙක ඇද පැමිණිලි කරයි අපට නුවණ තිබුණේ නැහැ ඔබ අපට යමක් නුදුන්නේ ඇයි? එබැවින් ඔවුන් ඔබගේ කන් දෙක අදියි, එහෙම නේද? අන් අය ගත්තත් නැතත්, ඔබ අඛණ්ඩව ලබා දෙන්න. බාප්දාදා දිනපතා ඔය දරුවන්ට බොහෝ සම්පත් ලබා දෙයි. සමහරු ඒවා සම්පූර්ණයෙන් ගන්නා අතර සමහරු ඔවුන්ගේ ධාරිතාවයට අනුව ගනී. එවිට බාප්දාදා කිසිදා මෙසේ පවසනවාද, 'මම ලබා දෙන්නේ නැහැ? ඔබ නොගන්නේ ඇයි?' බ්‍රහ්මිණ්වරුන්ගේ යුතුකම වන්නේ දීමයි. ඔබ පිරිනමන්නා ගේ දරුවන් නේද? හොඳයි ඔවුන් ඉල්ලන විට ඔබ ඔවුන්ට යමක් දෙන්නේ නම්, එවිට එය ඔවුන්ව ගන්නා අය බවට පත් කරවයි. ගන්නා අයට කිසිම විටෙක පිරිනමන්නාගේ දරුවන් විය නොහැක, ඔවුන්ට කිසිදා දේවතාවන් විය නොහැක. ඔබ දේවතාවන් වීමට යනවා නේද? ඔබගේ දේවතා ඇඳුම සූදානම්ද? නැත්නම් එය දැන් මහනවා හෝ සෝදනු ලබනවාද? එසේ නැත්නම් මැදීමට එය පසෙක දමා තිබෙනවාද? ඔබගේ දේවතා ඇඳුම ඔබ ඉදිරියේ පෙනෙන්ට තිබිය යුතුයි අද සුරදූතයෙක් සහ හෙට දිනයේ දේවතාවක්. ඔබ කී වතාවක් දේවතාවක් වී තිබෙනවාද? එබැවින් සෑම විටම මතකයේ තබාගන්න ඔබ

දානපතිගේ දරුවෙක් වන අතර දේවතාවක් වීමට යනවා. දානපතිගේ දරුවන් ප්‍රථමයෙන් අරගෙන පසුව දෙන්නේ නැහැ. 'මට ගෞරවය ලැබිය යුතුයි ප්‍රථමයෙන් මට ගෞරවය ලැබුණු විට ඉන්පසුව මා එය ලබා දෙන්නම්.' එය එසේ නොවිය යුතුයි. ඔබ සෑම විටම දානපතිගේ දරුවන්, නිරන්තරයෙන් දෙන අය. ඔබට නිරතුරුවම මෙවන් කුල්මත් බවක් තිබෙනවා නේද? එසේ නැත්නම් එය විටෙක අඩු වන අතර විටෙක වැඩියිද? ඔබ තවමත් මායාට සමුදී නැද්ද? හෙමිහිට සමු නොදෙන්න ඔබට එතරම් කාලයක් නැහැ. ප්‍රථමයෙන්, ඔබ පැමිණියේ පමා වෙලා, ඉන්පසුව ඔබ උත්සාහ දරන්නේ හෙමින් සීරුවේ නම්, ඔබගේ ගමනාන්තයට ඔබ ළඟා නොවෙයි. ඔබට විශ්වාසය තිබුණා, ඔබ කුල්මත් වුණා, ඉන්පසුව ඔබ පියාසර කිරීම ඇරඹුවා. එය දැන් පියාසර ස්ප්‍රීතියට කාලයයි. පියාසර කිරීම වේගවත් නේද? ඔබ පියාසර කාලයේ පැමිණීම ඔබගේ වාසනාවක්. එබැවින් ඔබ බොහෝ භාග්‍යවන්ත බව සෑම විටම අත්විඳින්න. ඔබට මුළු කල්පය පුරාම මෙවන් භාග්‍යයක් ලබා ගත නොහැක. එබැවින් දානපතිගේ දරුවන් වන්න ගැනීමේ සිතිවිල්ලක් පවා ඇති නොවිය යුතුයි. 'මට මුදල් දෙන්න, මට ඇඳුම් දෙන්න, මට කෑම දෙන්න.' දානපතිගේ දරුවන්ට ඉබේම සියලු දේ ලැබෙයි. යමක් ඉල්ලන අයට එය නොලැබෙයි. පිරිනමන්නෙක් වන්න, එවිට ඔබට නොකඩවා ඉබේටම ලැබෙයි. අච්චා.

**වරදානය:** ඔබට නිවැරදි ස්මරණය තිබී, සියලු බල සහිත කර්ම යෝගිවරයෙක් වී, ඔබගේ ආයුධ සෑම විටම ඔබ සමග තබා ගනිත්වා.

නිවැරදි ස්මරණය යනු, නිරන්තරයෙන් සියලු බල වලින් පිරිපුන් වීමයි. සතුරෙක් විලසින් ඔබ ඉදිරියට යම් සිදුවීමක් පැමිණි විට ඔබගේ ආයුධ ඔබ භාවිත නොකරන්නේ නම්, එවිට ඔබ ආයුධ ඇති කෙනෙක් ලෙස හැඳින්වෙන්නේ නැත. සෑම ක්‍රියාවකදීම ඔබට සිහි කිරීම තිබෙන විට ඔබ සාර්ථකත්වය ලබයි. ඔබට තත්පරයක් වත් කිසිවක් නොකර සිටිය නොහැකි සේම, යෝගාවේ නොසිට ඔබට කිසිම ක්‍රියාවක් කළ නොහැක. එබැවින් කර්ම යෝගීවරයෙක් වී ඔබගේ ආයුධ ළඟ තබාගන්න. නිසි වෙලාවට ඔබගේ අණට අනුව, ඔබගේ බල භාවිත කරන්න, එවිට ඔබ නිවැරදි යෝගීවරයෙක් ලෙස හැඳින්වෙයි.

**පාඨය:** තම සිතිවිලි සහ ක්‍රියා ශ්‍රේෂ්ඨ වන අය, මාස්ටර් සර්ව බලධාරීන්ය.

***** ඕම් ශාන්ති *****